# ලංකාආණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලද.

අංක 8,466—1939ක්වූ ජූලි මස 21 වෙනි දිනවූ සිකුරාද


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඩග නීති.

#### වන්දනාගමන් පිළිබඳ ආඥාපනතයි.

"වන්දනාගමන් පිළිබඳ ආඥාපනතයි" නම්කරනලද ආඥාපනතේ (133 වන පරිච්ඡේදය) 2 වන වගන්තියෙන් බලංකලත් ප්‍රකාර 1939 ජූලි මස 28වෙනි දින සිට දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පවත්වන්ට අදහස්කර තිබෙන පෙරහැර මංගල්‍යය සිරිත් ප්‍රකාර පවතීයයි යන අදහසින් මෙහි පහත දැක්වෙන නියෝග මෙම දූත්වීම මගින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේවන ඇන්ඩෘ කැල්ඩිකොට් නමැති මම විසින් පනවනලදී.

ඒ. කැල්ඩිකොට්,
ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ.

1939 ජූලි මස 19වෙනි දින.

#### දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ වන්දනාගමන.

##### නියෝග.

1. පෙරහැර කාලේදී හෝ ඊට කලින් දෙවුන්දර හෝ ඒ අසල බෝවෙන, පැතිරෙන හෝ හොත් වසංගත ස්වභාවයේ යම් රෝගයක් පටන්ගත්තොත් නැත්නම් උප දිසාපතිතුමාගේ කල්පනාවේ හැටියට වන්දනා කාලයේදී දෙවුන්දරට පැතිරඑන්නට පුළුවන් දකුණු පලාතේ වෙන යම් ස්ථානයක එබඳු රෝගයක් පවතීනම් වන්දනාගමන නතරකරන්නට හෝ පෙරහැර කාලය අවසානවූයේයයි ප්‍රකාශකරන්වද දෙවුන්දරට පිවිස් ඇවිත් සිටි සියල්ලන්ටම වහාම ඉන් පිටවී තම තමන්ගේ ගම්වලට හැරීයන්නට නියම කරන්වද ඔවුන් යායුතු මාර්ග මේ මේයයි නියමකරන්නවද උප දිසාපතිතුමාට නීතිප්‍රකාර බලය තිබේ.

2. බෝවෙන නොහොත් පැතිරෙන රෝගයකින් පෙලෙන කිසිම කෙනෙකුට දෙවුන්දරට ඇතුල්වෙන්ට තහනම්ය.

3. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙලෙන කෙනෙක් කිසිවෙකු විසින් දෙවුන්දරට නොගෙනා යුතුයි. තවද එවැනි රෝගයකින් පෙලෙන කෙනෙකුට දෙවුන්දරට ඒමට කිසිවෙකු විසින්වත් අනුබලදීමද නොකල යුතුයි.

4. යම් කිසිවෙකුට බෝවෙන හෝ පැතිර යන රෝගයක් වැලඳුනහොත් නැත්නම් එවැනි රෝගයකින් පෙලෙන්නේයයි දැන දැනම රෝගියෙක් සමග වාසයකරන්නට සිද්ධවුනොත් ඒ බව සනීපාරක්ෂක පරීක්ෂකතුමාට හෝ වෛද්‍යමුලාදෑනිතුමාට හෝ ඔවුන් නැතිවිට දෙවුන්දර සිටින පොලිසියේ මුලාදෑනීන් අතුරෙන් උසස් මුලාදෑනියාට වහාම දැන්විය යුතුයි.

5. (1) වෙළඳාම් පිණිස දෙවුන්දරට ගෙනඑන කොයිනම ද්‍රව්‍යයක්වත් උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂා සභාවේ ප්‍රධානතුමා විසින් හෝ වෙන්කොට තබා තිබෙන ස්ථානයක හැර වෙන කිසිම ස්ථානයක ඒ ද්‍රව්‍ය කිසිවෙකු විසින් වෙළඳාම පිණිස නොතැබිය යුතුයි.

(2) සනීපාරක්ෂා පරීක්ෂකතුමා විසින් හෝ වෛද්‍යමුලාදෑනිතුමා විසින් හෝ ඔවුන් නැතිවිට මුදලිතුමා විසින් හෝ දෙවුන්දර සිටින පොලිසියේ මුලාදෑනි අතුරෙන් උසස් පොලිස් මුලාදෑනියා විසින් හෝ කෑමට නුසුදුසුයයි ප්‍රකාශකරනලද මසක් හෝ වෙනයම් කෑම් බීම් වර්ගයක් කිසිවෙකු විසින් නොවිකිනිය යුතුයි.

(3) පොලිසියේ නිලධාරීන්ටත් හෝ සනීපාරක්ෂා පරීක්ෂකතුමාට හෝ ආහාරයට නුසුදුසුයයි ප්‍රකාශකරනලද මස් හෝ කෑම බීම සහනමට ගෙන විනාශකරදමන්ට නීතියානුකූලව බලය තිබේ.

6. (1) භෝජන ශාලාවල්ද කෝපි සහ තේවතුර කඩද පිරිසිදුව සනීපය ආරක්ෂාවන පරිදි තබාගත යුතුයි.

(2) විකිනීමට තබනලද සියලුම කැවිලි සහ රසකෑම් ජාතිද උයනලද කෑම ද්‍රව්‍යයන්ද නීතියාකාර සාදනලද මැස්සන්ට යාමට නුපුළුවන් වීදුරු පෙට්ටිවල බහාතැබිය යුතුයි.

(3) පාවිච්චියට ඉතිරීවන තේ, කෝපි, කිරි හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය බීම් එසේ මෙසේ නොදමා ඊට සුදුසු මෙහි පහත විස්තර කරනු ලබන අන්දමේ භාජනවල එකතුකොට සනීපාරක්ෂා සඳහා පත්කරනුලැබූ අයවලුන් පැමිණ ගෙන යනතෙක් සෑම වේලාවල්හිම වසා තැබිය යුතුයි.

(4) වෙලෙඳාම් පිණිස සාදනලද ගොඩනැගිලි මැසි කොටු ආදි සෑම ස්ථානයකම කුණුරොඩු තැන්පත්කර තැබීම සඳහා ලෝහයෙන් හෝ ලීවලින් සාදනලද සහ අඟල් 4½කට අඩුනොවන ප්‍රමාණයක භාජනයක් සපයා තබා එම ස්ථානයෙහි රැස්වන කුණුකසල සියල්ලම එම භාජනයතුල තැන්පත්කර තැබිය යුතුයි. කුණුකසල එහි තැන්පත්කරන හෝ ඉන් අස්කරන කාලයන්හි හැර අනෙක් සෑම වේලාවෙහිම එය ලෝහ හෝ ලී මූඩියකින් වසා තැබිය යුතුයි.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

No. 13,224, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1939ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දිනවූ සඳුද පෙරවරු 9ට බලන්ගොඩ කාර්‍යාලයේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරළේ හෙලඋඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 304. ගම—දමහන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 134 | මහහේන | කොරණ පොකුණුවිට පදිංචි බී. ආර්. දසනායක | හේන | 2 0 14 |
| 135 | මැව්හක්කෙහේන, දිවිගාලෙහේන | එම | එම | 2 1 4 |
| 125AA | වෙලන්කැටියගෙ හේන, කටුවෙහේන | ආණ්ඩුව | හේන (පාරට ඉතුරුකර තිබෙන බිම) | 1 0 23* |

* බදුදීමට පමණයි.

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1939ක්වූ ජූලි මස 19වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ නිමිත.

---

No. 13,225, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1939ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දිනවූ සඳුද පෙරවරු 9ට බලන්ගොඩ කාර්‍යාලයේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරළේ හෙලඋඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 310. ගම—අගලේකුඹුර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 170 | මහවත්තෙහේන | ඉඹුලම්බුරේ පදිංචි බෝවත්තෙගෙදරල්ලාගේ හිංගිරිහාමි | හේන | 0 0 16 |
| 171 | එම | එම | එම | 1 2 32 |
| 181 | එම | එම | පරණ ගම්සභාපාරෙන් කොටසක් | 0 0 8 |
| 197 | එම | එම | හේන | 0 1 5 |
| 268 | තල්ගස්වත්තේහේන | එම | එම | 0 2 1 |
| 278 | ඉදිගස් මුල් හල් හේන, මකුල්වලේහේන | අගලේකුඹුරේ පදිංචි පාන්තියවත්තේ කිරිහතා | එම | 4 3 7 |
| 288 | කටුකොන්දේහේන | එම | එම | 1 0 13 |
| 299 | උස්මීනහමුලහේන | අගලේකුඹුරේ පදිංචි ඉඹුල්ගස්වත්තේදුරයාලාගේ කිරිඋක්කු | එම | 1 3 11 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1939ක්වූ ජූලි මස 19වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ නිමිත.

---

No. 13,226, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1939ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දිනවූ සඳුද පෙරවරු 9ට බලන්ගොඩ කාර්‍යාලයේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරළේ හෙලඋඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 314. ගම—රජවක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 37A | කෝවිල්තැන්නහේන | රජවක පදිංචි මැදඉරේ කිරිඅප්පුහාමි | හේන | 1 0 6 |
| 48½ | අඹබලම්බුල්ලෙගොඩ හේන වත්ත | හැඳුන්ගමුවෙ පදිංචි හොරකන්වලගේ එමිසා | වත්ත | 0 0 5 |
| 49 | අඹබලම්බුල්ලෙගොඩ හේන | එම | හේන | 0 0 7 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1939ක්වූ ජූලි මස 19වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ නිමිත.

---

No. 13,227, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1939ක්වූ සැප්තැම්බර් මස 26 වෙනි දිනවූ අඟහරුවාද සහ ඊලඟ දිනදීත් පෙරවරු 9ට බලන්ගොඩ කාර්‍යාලයේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරළේ හෙලඋඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 19ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 474. ගම—මස්සෙන්න.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 162 | තල්ගස්වත්ත | බලන්ගොඩ පදිංචි අසන් ලෙබ්බෙ අබ්දුල් කරීම් ලෙබ්බෙ, (2) දවුදලෙබ්බෙ නයිනාලෙබ්බෙ විසින් හිඟ මුදල ගෙවාතැන | හේ | 1 0 4 |
| 199 | ඌවගේ අරවගොඩ | දමහන පදිංචි පල්ලෙකුඹුරෙදුරයාලාගේ කිරිමැණිකා | හේන | 0 2 37 |
| 205 | මිල්ලගහකුඹුරගොඩ වත්ත | ගුණතිලක ආරච්චි | හේ | 0 3 0 |
| 206 | එම | හතාන්දුරගේ කිරිබබා | එම | 1 0 18 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 222 | හෝම්පලතැන්න හේන | අබ්දුලෙබ්බෙ මරිකාර් හසන් මරිකාර් | හේන | 1 | 1 | 0 |
| 224 | හෝම්පලතැන්න හෙවත් කැටගහහේන | මිස්හසන්න පදිංචි දිසානායක මුදියන්සෙලාගේ පුංචිමැනිකේ | වත්ත | 1 | 0 | 11 |
| 233 | කෙම්බුකුම්බිගේ හේන | ජී. ඒ. ඩබ්ලිව්. ඩී. ඇම්. දසනායක බණ්ඩා | හේන | 0 | 0 | 22 |
| 234 | කැබිලිගස්දෙනිය මූකලාන | හෙට්ටිමිකානරාලලාගෙ යසෝහාමි | මූකලාන | 0 | 0 | 34 |
| 236 | දළුගලහේන | උදුල්ලගේ අර්නෝලිස් | හේන | 0 | 2 | 22 |
| 237 | එම | එම මර්නෝලිස් | එම | 0 | 2 | 25 |
| 238 | එම | එම ඔංගෝ | එම | 0 | 2 | 26 |
| 239 | එම | (1) උදුල්ලගේ යසරත්න සිරිසෝමා, (2) එම ලීලා | එම | 0 | 2 | 27 |
| 240 | එම | උදුල්ලගේ සියනේරිස් | එම | 0 | 2 | 25 |
| 241 | එම | එම පුංචිනෝනා | එම | 0 | 2 | 26 |
| 243 | එම | තම්පලාවත්තෙ ආරච්චිල්ලාගෙ අනදහාමි | එම | 0 | 3 | 6 |
| 244 | එම | අබ්දුලෙබ්බෙ හසන් මරිකාර් | එම | 2 | 3 | 10 |
| 254 | — | ගෝර්ඩන් ෆ්‍රේසර් සහ සමාගම, කොළඹ | වතුපාර (පිටිපිහිල වෙනුවෙන් සාදනලද පාර) | 0 | 0 | 17* |
| 259 | දළුගලහේන | අබ්දුලෙබ්බෙ මරිකාර් හසන් මරිකාර් | හේන | 2 | 1 | 1 |
| 261 | — | ගෝර්ඩන් ෆ්‍රේසර් සහ සමාගම, කොළඹ | වතුපාර (පිටිපිහිල වෙනුවෙන් සාදනලද පාර) | 0 | 0 | 33* |

* ඕදුදීමට පමණයි.

හතරේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් සේරුම්කරණ නිලධාරිතුමාගෙන්ද, ඒවාගේ පිටපත් කොළඹ සර්වේයර් ජනරාල් උත්තමයාණන්ගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1939ක්වූ ජූලි මස 19වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උත්තමයාණන්ගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. විජුම්සිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උත්තමයාණන් වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට එනම් :—වත්තල සැනිටරි බෝඩ් මාර්ගකමිටුව දියුණුකිරීම පිණිස සහ පොදු කාන්තුස්සි සෑදීම පිණිසත් මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකාරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ (203වෙනි පරිච්ඡේදය)" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. A 1,007. ගම—වත්තල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | මල්වත්ත හෙවත් කෝන්ගහවත්ත, මරිපනම් නො. 12 කොටසක් | අවුරුදු 30ක් වයස පොල්ගස් 2ක්ද, අවුරුදු 3ක් වයස පේරගහක් සහ කොසෙල්ගස් 17ක්ද ඇති ඉඩම | ජයමුනි චාර්ලිස් සිල්වා සහ පැට්රික් පොන්සේකා, වත්තල | 0 | 0 | 7·20 |
| 2 | මල්වත්ත හෙවත් පන්විලගෙවත්ත, මරිපනම් නො. 10 කොටසක් | අවුරුදු 30ක් වයස පොල්ගහක්ද, අවුරුදු 10ක් වයස පුවක්ගස් 3ක්ද ඇති ඉඩම | එච්. ඇම්. ඇස්. ගුණසේකර, රාගම | 0 | 0 | 1·67 |
| 3 | එම | (වැවිලි නැති) ඉඩමෙන් කොටසක් | එම | 0 | 0 | 1·47 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම හෝ හොත් තමුන් වෙනුවට ක්‍රියාකාරණ අය වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 15වෙනි දින පෙරවරු 9ට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූලි මස 17වෙනි දින කොළඹ කච්චේරියේදීය.

සී. ඒ. විල්කි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වමිස.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—වත්තල සැනිටරි බෝඩ් මාර්ගකමිටුව දියුණුකිරීම පිණිස සහ පොදු කාන්තුස්සි සෑදීම පිණිසත් මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකාරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ (203වෙනි පරිච්ඡේදය)" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. A 1,008. ගම—මාබෝල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත, මරිපනම් නො. 782 කොටසක් | අවුරුදු 40ක් වයස පොල්ගහක් සහ අවුරුදු 15ක් වයස පොල්ගස් 2ක් ඇති ඉඩම | කේ. සී. ඇෆ්. දීන්, මාබෝලෙ | 0 | 0 | 4·6 |
| 2 | එම | අවුරුදු 15ක් වයස පොල්ගහක් ඇති ඉඩම | එම | 0 | 0 | 4·7 |
| 3 | එම | අවුරුදු 40ක් වයස පොල්ගස් 4ක් ඇති ඉඩම | එම | 0 | 0 | 9·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම, හෝ හොත් තමුන් වෙනුවට ක්‍රියාකාරණ අය වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 15වෙනි දින පෙරවරු 9.30ට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූලි මස 17වෙනි දින කොළඹ කච්චේරියේදීය.

සී ඒ. විල්කි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වමිස.

ආණ්ඩුවේ කටයුත්තක්ව, එනම්:—ලෝලුවාගොඩ ගොවිජනපදයට යාමට පාරක් සෑදීමට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකාරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ (203 පරිච්ඡේදය)" 5 වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,012. ගම—ලෝලුවාගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කෝන්ගහවත්ත .. | අවුරුදු 4–8 වයස පොල්ගස් 5ක් ඇති පොල් ඉඩම | දෙන් චාර්ලිස් අමරතුංග, ලෝලුවාගොඩ | 0 | 0 | 15·5 |
| 2 | එම .. | අවුරුදු 30–40 පොල්ගස් 2ක්ද, අවුරුදු 20–25 පොල්ගස් 2ක්ද, අවුරුදු 2ක් වයස පොල් පැල 2ක්ද, අවුරුදු 15ක් වයස පුවක්ගස් 28ක්ද ඇති පොල් ඉඩම | එම .. | 0 | 0 | 18·8 |
| 3 | කැටකෑලගහවත්ත | අවුරුදු 30–40 වයස පොල්ගස් 5ක්ද, අවුරුදු 20ක් වයස පොල්ගස් 3ක්ද, අවුරුදු 2–5 වයස පොල්පැල 5ක්ද, පුවක්ගස් 5ක්ද, කජු ගහක්ද, අඹගහක් සහ බෙලිගහක්ද, අවුරුදු 8–15 වයස කජුගහක්ද, හල්මිල්ලගහක් සහ පුවක්ගස් 57ක්ද ඇති පොල්ඉඩම | රත්නායක අප්පුහාමිල්ලාගේ පුංචප්පුහාමි, ලෝලුවාගොඩ | 0 | 0 | 22·6 |
| 4 | අඹගහවත්ත .. | අවුරුදු 40–50 වයස පොල්ගස් 2ක්ද, අවුරුදු 1ක් වයස පොල්පැලයක්ද, අවුරුදු 4ක් වයස කජුගහක්ද, අත්හැරදපු ලිදක්ද ඇති පොල් ඉඩම | වික්‍රමසිංහ සේනානායක කොර්නේලිස් පෙරේරා, ලෝලුවාගොඩ | 0 | 0 | 5·2 |
| 5 | එම .. | (වැව්ලිහැති) පොල්ඉඩමක කොටසක් .. | දෙන් චාර්ලිස් අමරතුංග, ලෝලුවාගොඩ | 0 | 0 | 2·5 |
| 6 | කැටකෑලගහවත්ත | අවුරුදු 10–15 පුවක්ගස් 6ක් ඇති පොල්ඉඩමක කොටසක් | රත්නායක අප්පුහාමිල්ලාගේ පුංචප්පුහාමි, ලෝලුවාගොඩ | 0 | 0 | 0·9 |
| 7 | එම .. | අවුරුදු 3–4 කජුගහක් සහ දෙහිගහක්ද, අවුරුදු 8–10 වයස හල්මිල්ලගහක්ද, දෙඹගහක් සහ ගම්මිරිස්වැල් 2ක්ද, අවුරුදු 25ක් වයස පොල්ගහක්ද, අවුරුදු 30–40 පොල්ගස් 6ක්ද, අවුරුදු 20ක් වයස මීගහක් සහ අඹගහක්ද, අවුරුදු 15ක් වයස පුවක්ගස් 11ක්ද ඇති පොල්ඉඩම | ඉලන්ගන්පතිරන්නෙහෙලාගේ සුදිංජිස් අප්පු, එම බන්ඩාරිහාමි, එම බර්නෙලිස් අප්පු, සුබසේකර ආරච්චිරාලලාගේ රොසිදිංනෝනා, දෙන් චාර්ලිස් අමරතුංග සහ දෙන් විලියම් පොලිස් මුලාදෑනියා, ලෝලුවාගොඩ | 0 | 0 | 22·7 |
| 8 | අඹගහවත්ත .. | අවුරුදු 15ක් වයස පුවක්ගස් 14ක් සහ කොස් ගහක්ද, අවුරුදු 25ක් වයස පොල්ගස් 2ක්ද, අවුරුදු 30–40 වයස පොල්ගහක්ද, අවුරුදු 2–7 වයස අඹගහක්ද, සියඹලාගහක්ද, කිතුල් ගහක් සහ ගම්මිරිස්වැල් 5ක්ද ඇති පොල් ඉඩම | ඉලන්ගන්පතිරන්නෙහෙලාගේ සෙදිරිස් අප්පුහාමි, ලෝලුවාගොඩ | 0 | 0 | 3·9 |
| 9 | කැටකෑලගහවත්ත | (වැව්ලිහැති) පොල්ඉඩමක කොටසක් සහ දෙහිය | ඉලන්ගන්පතිරන්නෙහෙලාගේ සුවාරිස් අප්පු, එම බන්ඩාරිහාමි, එම බර්නෙලිස් අප්පු, සුබසේකර ආරච්චිරාලලාගේ රොසිදිංනෝනා, දෙන් චාර්ලිස් අමරතුංග සහ දෙන් විලියම් පොලිස්විදානෙ, ලෝලුවාගොඩ | 0 | 0 | 16·2 |
| 10 | එම .. | අවුරුදු 30–40 වයස පොල්ගහක් ඇති පොල් ඉඩම | එම .. | 0 | 0 | 1 |
| 11 | එම .. | අවුරුදු 30–40ක් වයස පොල්ගස් 2ක්ද, අවුරුදු 15ක් වයස පුවක්ගස් 7ක්ද, අවුරුදු 3ක් වයස දිවුල්ගහක්ද ඇති පොල්ඉඩම | වන්නිආරච්චිගේ හෙන්ද්‍රික් ෆොන්සේකා සහ දෙන් චාර්ලිස් අමරතුංග, ලෝලුවාගොඩ | 0 | 0 | 2·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමයන් ප්‍රකාර තිබෙන හැටියට මෙයින් දන්වමිදෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතැයි කියන්නාවූ තැනැත්තන් හැම කෙනෙක් තමුන් වෙනුවට ක්‍රියාකරන අය විසින් 1939ක්වූ අගෝස්තු මස 16 වෙනි දින දවල් 2ට මීරිගම නඩුහාලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටිනා මුදල් කොපමණ නම් ඒත් ඇත්නම් තමුන්ගේ අයිතිය ගැන තොරතුරු කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1939ක්වූ ජූලි මස 17 වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

සී. ජී. විල්ෆ්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

---

ආණ්ඩුවේ කටයුත්තක්ව, එනම්:—කලපළුවාව-හලන්ගම පාර උස්කිරීම සහ පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකාරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ (203 වෙනි පරිච්ඡේදය)" 5 වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,018. ගම—වල්පොල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | අව්වාලවලකුඹුර .. | බෝක්කුවට අයිති මෙහෙන්වැඩකර තිබෙන අංශ බින්තියක කොටසක් ඇති කුඹුර | වල්පොලමුදලිගේ දෙන් ජේම්ස්, එම දෙන් දවිත්, එම දෙන් පබිලිස් සහ එම දෙන් පොඩිඅප්පුහාමි, හලන්ගම | 0 | 0 | 7·3 |
| 2 | එම .. | එම .. .. | එම .. .. | 0 | 0 | 3·8 |
| 3 | අව්වාලවලවත්ත . | අවුරුදු 6ක් වයස පොල්ගහක් ඇති ඉඩම | එම .. .. | 0 | 0 | 0·7 |
| 4 | අව්වාලවලකුඹුර .. | කුඹුර .. .. .. | තන්තිරිගේ විලියම්, එම සයිමන්, එම මැගිනෝනා, වල්පොල සහ තන්තිරිගේ පබිලිස්, කලපළුවාව | 0 | 0 | 4·7 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | අච්චාලවල කුඹුර .. | බෝක්කුවකට අයිති ගම්සන්වැඩකර තිබෙන අංශ හිත්තියක කොටසක් ඇති කුඹුර | වල්පොලමුදලිගේ දෙදෙන් ඒබ්‍රහම්, එම දෙදෙන් දමිත්, එම දෙදෙන් පසිලිස්, සහ එම දෙදෙන් පොඩිඅප්පුහාමි, තලන්ගම | 0 0 1.5 |
| 6 | එම .. | එම .. .. | එම .. .. | 0 0 8·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාව දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හිනුකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 17වෙනි දින පෙරවරූ 10ට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූලි මස 17වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්තවරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බොක්කාවෙල පිටවෙල ඇල වෙනස්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වෙනි ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර ඕට තුණ ලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

පිඹුරේ නො. A 517. ගම—වෑවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොහොඹගහමුලවත්ත .. | උණගස් කිපයක් තිබෙන මුඩුබිම . | හරන්කහගේ වෑවල පදිංචි දෙන් ජයතිස්ස විරතුංග | 0 0 3·11 |
| 2 | එම .. | දෙපැත්ත බඳමින් බැඳ තිබෙන ඇල .. | එම .. | 0 0 0·54 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාව දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ හිනුකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 11වෙනි දින පෙරවරූ 8.30ටත් [illegible] ඉහතකී ඉඩමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. අයිතිකම් ඔප්පුකිරීමට තිබෙන ඔප්පුද ගෙනඑන්ට ඕනෑය.

වර්ෂ 1939ක්වූ ජූලි මස 17වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

පී. ඇට්. රෙනිසන්,
ආණ්ඩුවේ උප ඒජන්තවරයා.

---

## ඉඩම් සංග්‍රහකිරීමේ දැන්වීම.

අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතියේ ලාංඡනිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් මොණරාගල තානායමේදී වර්ෂ 1939ක්වූ සැප්තැම්බර් මස 13වෙනි දින පූ. භා. 10ට 1935වෙනි අංක 19 දරන ඉඩම් සංග්‍රහකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වනබැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මේ ඉඩම්කච්චේරි මධ්‍යම පළාතියේ ලාංඡනිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත බදුල්ලේ කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 25වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක්කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දිම හෝ නොදීම යුතුතිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙණීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තමා ඉල්ලීම සම්බන්ධයෙන් නාවදුරටත් ක්‍රියාකිරීමට අකැමැති බැව් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමා ගෙන් විභාගකළ යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

### දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 172. ගම—බුත්තල.

| කෑබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | | | | මේ ඉඩම්වල වැවීමට සුදුසුශාක වගී. |
|---|---|---|---|---|---|
| 80 | ..142 | 0 | 29 | .. | — |
| 81 | .. 6 | 0 | 28 | .. | — |
| 81C | .. 6 | 2 | 10 | .. | — |

F. V. P. 256. ගම—දෙහගල්අරම්බ.

| කෑබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | | | | මේ ඉඩම්වල වැවීමට සුදුසුශාක වගී. |
|---|---|---|---|---|---|
| 110 | ..194 | 3 | 21 | .. | — |
| 114 | .. 6 | 3 | 33 | .. | — |
| 115 | .. 0 | 1 | 13 | .. | — |
| 116 | .. 97 | 2 | 35 | .. | — |
| 116B | .. 9 | 2 | 15 | .. | — |
| 116D | .. 5 | 1 | 36 | .. | — |
| 116E | .. 9 | 0 | 15 | .. | — |

---

### දැන්වීමයි.

ලොකු ඇත්දත් කුට්ටමක් සහ කුඩා ඇත්දත් කුට්ටමක්ද වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 4වෙනි සිකුරාදා පස්වරූ 1ට කොළඹ කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම ඇත්දත් සතියේ දිනවල කොළඹ කච්චේරිය පවත්වන වේලාවන්හී බැලිය හැක.

ජේ. ඇෆ්. ඩී. සිල්වා,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා වෙනුවට.

වර්ෂ 1939ක්වූ ජූලි මස 17වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.